සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වනඅධියර, 4වන මහල ,සෙත්සිරිපාය ,බත්තරමුල්ල.
1ம் கட்டம்,4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st Stage , 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/07/SD/16/ENV

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2017.01.04

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකවරුන්,

## "සමෘද්ධි හරිත උයන" විශේෂ වැඩසටහන - 2017

### 01. අරමුණ

01.01 අතිගරු ජනාධිපතිතුමා විසින් 2016 - 2018 වර්ෂ තුනක කාලයතුළදි ශ්‍රී ලංකාවේ වන ආවරණය 32% දක්වා වැඩිකර ගැනීම පිණිස රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික පාර්ශවයන්ගේ සක්‍රීය දායකත්වය ඇතිව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනක් ලෙස හඳුන්වා දී ඇති "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන හා "තිරසර යුගයක්" ජාතික වැඩපිළවෙලට සමගාමීවළුම අරමුණු ඉටු කිරීම වෙනුවෙන් සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් "සමෘද්ධි හරිත උයන" විශේෂ වැඩසටහන 2017 වර්ෂ තුළදි ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

01.02 ඒ අනුව 2017 පෙබරවාරි 09 වන දින පෙ.ව. 9.36 ට එළැඹෙන සුභ මොහොතින් සමාරම්භක වැඩසටහන සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි,තෝරාගනු ලබන එක් ස්ථානයකදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ලබන අතර ඉන්පසු වර්ෂය පුරාමසෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම "සමෘද්ධි හරිත උයන" රුක්රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

01.03 ඒ අනුව, "සමෘද්ධි හරිත උයන" රුක් රෝපණ වැඩසටහන මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කර ගැනීම තුළින් වන සම්පත සහ ජල සම්පත ආරක්ෂා කර ගැනීම.
- සුවිශේෂි පාරිසරික පද්ධති ආරක්ෂා කර ගැනීම.
- විනාශවී ගිය භූමි ප්‍රදේශ වන වගා තුළින් ප්‍රතිෂ්ඨාපනය කිරීම.
- හරිත උද්‍යාන බිම් ප්‍රමාණය වැඩි කිරීම.
- නිසරු බිම්වල හරිත උයන් නිර්මාණය කිරිම.
- පරිසරය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය හා උනන්දුව වර්ධනය කිරීම.
- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරිම.
- පරිසරය සුරැකීම සඳහා අන්තර් ආයතනික යාන්ත්‍රණයක් ඇති කිරිම .

- ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම.
- දේශීය පැළ තවාන් / සැපයුම් කරුවන් බිහි කිරීම හා එතුලින් ඔවුනගේ ආදායම් මාර්ග වැඩි කිරීම.
- ජනාශ්‍රිත හා රථවාහන වැඩිපුර ගැවසෙන නාගරික ප්‍රදේශවල පිරිසිදු වායුව ඇති කිරීම.
- තිරසර සංවර්ධන ඉලක්ක අනුව මිහිමත ජීවිතය යහපත් කිරීමට දායක වීම.

01.04 මෙම වැඩසටහන යටතේ හදුනාගත හැකි නිශ්චිත භූමි ප්‍රදේශ ලෙස කඳුමුදුන්, ඉහළ ජල ධාරා පෝෂක ප්‍රදේශ,පාසල් භූමි,මාර්ග දෙපස, වැව් රක්ෂිත,ගංගා ඇළ දොළ දෙපස, ජල රක්ෂිත,කාර්යාල භූමි, නාගරික ජනාවාස, වෙරළ තීර ආශ්‍රිතව හරිත උයන් නිර්මාණය කරමින් රුක් රෝපණ කටයුතු සිදු කළ හැකිය.

01.05 විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් "සමෘද්ධි හරිත උයන් " වැඩසටහන්වල ගුණාත්මක භාවය රැක ගැනීම සඳහා කටයුතු කළ යුතුය. මේ සඳහා පසුගිය වර්ෂවලදී පැවති වැඩසටහන්වලින් ලද අත්දැකීම් පදනම් කර ගනිමින්, අවශ්‍ය පරිදි දැනුම හා සම්පත් හුවමාරු කර ගනිමින් මෙම නව වැඩ සටහන හඳුනාගත් නිශ්චිත ස්ථානවල සැලසුම් සහගතව, තිරසාර බව තහවුරු වන පරිදි ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙනු ලැබේ.

## <u>02. උපාය මාර්ග අනුගමනය කිරීම</u>

02.01 "සමෘද්ධි හරිත උයන" විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ වනසම්පත මෙන්ම ජල සම්පත සංරක්ෂණය කිරීමේ බලාධිකාරිය හිමි රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග ඒකාබද්ධ වී දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය අනුව කටයුතු කරමින් දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාල හරහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සමෘද්ධි සමිති ජාලය සමග තිරසාර ප්‍රජා වන වගා වැඩසටහනක් ලෙස "සමෘද්ධි හරිත උයන" වැඩසටහන2017 වර්ෂය තුළදී ක්‍රියාවට නැංවීමයි. එහිදි විවිධ ප්‍රවේශයන් හරහා රුක් රෝපණය පිළිබඳව සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රජාවගේ ධනාත්මක ආකල්ප වර්ධනය වන අයුරින් කටයුතු කිරීමට අවධානය යොමු කරන අතර, ප්‍රජාව විසින්ම නිපදවනු ලබන පැළ වර්ග රෝපණය කිරීමට පෙළඹවීම ඉතා වැදගත් වේ. එමෙන්ම, පැළ අවශ්‍යතාවය එම ප්‍රදේශයෙන්ම සපයාගැනීමට හැකි වන පරිදි එම ප්‍රදේශතුළම පැළතවාන් ඇති කිරීමට කටයුතු කිරීමද ඉතා වැදගත් බව අවධාරණය කෙරේ.

02.02 විශේෂයෙන්ම සමෘද්ධි කැකුළු ළමා සමාජවල දරුවන්"සමෘද්ධි හරිත උයන" වැඩසටහන සඳහා ක්‍රියාකාරිව සම්බන්ධ කරගැනීම වැදගත් වේ. ඉදිරියේදී පැවැත්වීමට නියමිත සමෘද්ධි කැකුළු ළමා සමාජ තරඟාවලිය හා ඒකාබද්ධව සමෘද්ධි හරිත උයන වැඩසටහන සම්බන්ධයෙන් ළමා සමාජවල දරුවන් අතර තරඟ අංශ සංවිධානය කිරීමට ද සැලසුම් කර ඇති බව දන්වමි. මෙහිදී හොඳම පැලතවාන, හොඳම පරිසර රචනාව, හොඳම පරිසර වැඩසටහන, හොඳම පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කරන සමෘද්ධි කැකුළු ළමා සමාජය වැනි අංග ඇතුලත්වීමට යෝජිත අතර මේ පිළිබඳ වැඩි විස්තර ඉදිරියේදී ඔබ වෙත නිකුත් කරනු ලැබේ. එබැවින් සමෘද්ධි කැකුළු ළමා සමාජවල දරුවන් සම්බන්ධ කරගනිමින් මෙම වැඩසටහන ඉදිරියට ගෙනයාමට අවශ්‍ය කටයුතු සංවිධානය කරගැනීම වැදගත් වන බව ද විශේෂයෙන් අවධාරණය කරමි.

02.03 තව ද සමෘද්ධි හරිත උයන්වල රුක් රෝපණ කටයුතු සඳහා සමෘද්ධි ප්‍රජාව තම කැමැත්තෙන්ම ඉදිරිපත් වන ආකාරයට පොළඹවා ගැනීම වැදගත් වන අතර, ඒ සඳහා තමන්ගේ හා පවුලේ සමාජිකයන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා සැමරීම, උපන්දින, වසරේ වැදගත් දින, සැමරීම සහ උත්සව අවස්ථා ආදි වූ විවිධ අවස්ථා නිමිති කර ගෙන මෙම " සමෘද්ධි හරිත උයන" වැඩසටහන වඩාත් කාර්යක්ෂම හා සඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකිය.

02.04 රාජ්‍ය ආයතන/ පෞද්ගලික ආයතනතුළ දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින ඵලදායිතා කව / පරිසර කව මගින් මෙම හරිත උයන් වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය.පැළ තවාන් ඇති කිරීම සඳහාද මෙම කව උපයෝගී කර ගත හැකි වේ.

02.05 ආරක්ෂක අංශවල සක්‍රීය දායකත්වය ලබා ගැනීම මගින් හරිත උයන් රෝපණ වැඩසටහන් ත්‍රියාත්මක කිරීමටද අවධානය යොමු කෙරේ. කඳවුරු භූමි සහ ආරක්ෂක අංශ යටතේ පවතින ඉඩම්වල මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිය.

02.06 පාසල් ආශ්‍රිතව හරිත උයන් ආරම්භ කිරීම ඉතා ඵලදායි කටයුත්තක් වන අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශතුළ සෑම පාසලක්ම ආවරණය වන පරිදි හරිත උයන් වැඩසටහන් පාසල් භූමියතුළ පාසල් ළමුන් සහභාගී කරවාගෙන ක්‍රියාත්මක කිරීමට ද උපදෙස් දෙනු ලැබේ.

02.07 " සමෘද්ධි හරිත උයන" වැඩසටහන හුදෙක් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ ඒකපාර්ශවික වැඩසටහනක් නොවන අතර, ආයතන රාශියක ඒකාබද්ධ ප්‍රවේශයකින් ක්‍රියාත්මක විය යුතු වැඩසටහනකි. වන සංරක්ෂණ, පරිසර, වාරිමාර්ග,මහවැලි,වැවිලි කර්මාන්ත, අධ්‍යාපන, පළාත් පාලන, කෘෂි කර්ම, ගොවිජන සංවර්ධන, පළාත් මාර්ග, මහා මාර්ග, වෙරළ සංරක්ෂණ ආදි වූ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි, සංස්ථා සහ සංවිධාන රාශියකින් පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය වශයෙන් පත් කරනු ලැබූ නිළධාරීන් රාශියක් සමග සම්බන්ධීකරණය වෙමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහනකි. මෙම සම්බන්ධීකරණය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු , ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, කෘෂිකර්ම කමිටු, පරිසර කමිටු,කොට්ඨාශ දින රැස්වීම්ආදිය හරහා මනා සම්බන්ධීකරණයක් " සමෘද්ධි හරිත උයන" වැඩසටහනට අදාළව සකස් කර ගන්නා ලෙසත් එමගින් රෝපණ ද්‍රව්‍යයන් තාක්ෂණික උපදෙස් සහ වැඩසටහන් සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සහයෝගය ලබා ගැනීමට ද ඉවහල් වනු ඇත.

## 03 <u>ක්‍රියාත්මක කිරීම</u>

03.01 මේ සඳහා සියලුම දිස්ත්‍රික්ක වලින් සුදුසු නිශ්චිත රාජ්‍ය/පොදු/පුද්ගලික ස්ථාන හඳුනාගෙන "සමෘද්ධි හරිත උයන" වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරගන්නා ලෙස දන්වන අතරමෙම

වැඩසටහනෙහි සමාරම්භක වැඩසටහන් මාලාව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි එක් වැඩ සටහනකින් ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කරන ලෙස කාරුණිකවදන්වමි.

03.02 සමාරම්භක වැඩසටහන සඳහා තෝරාගනු ලබන භූමිය සම්බන්ධ සියලු විස්තර, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන හා වැය ඇස්තමේන්තුව 2016.01.18 දිනට පෙර සමාජ සංවර්ධන අංශයට එවන ලෙසත් ඉන් අනතුරුව අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කරන බව දන්වමි.

03.03 මෙම වැඩසටහන් මාලාව සාර්ථකව ආරම්භ කිරීමට හැකි වන සේ පහත සඳහන් සියළු කටයුතු ඉහත සඳහන් දිනට පෙර සංවිධානය කර ගැනීම උචිත බව ද දන්වමි.

- සමාරම්භක වැඩසටහනට අදාළව නිශ්චිත ස්ථානය / නිශ්චිත භූමි ප්‍රදේශය හඳුනා ගැනීම.
- රෝපණය කිරීමට සුදුසු පැළ වර්ගය සහ අනිකුත් අවශ්‍යතා තීරණය කිරීම සහ ඒ සඳහා වැයවන වියදම ඇස්තමේන්තු කිරීම.
- ප්‍රදේශයේ දේශපාලන නායකත්වය, ප්‍රභූන්, සමෘද්ධි සමිති කණ්ඩායම්, අදාළ සියලුම නිළධාරීන් සහ මහජනතාව දැනුවත් කිරීම හා සමාරම්භක වැඩසටහනට සහභාගී කරවා ගැනීම.
- සමෘද්ධි කැකුළු ළමා සමාජවල දරුවන් සම්බන්ධ කර ගැනීම.
- වැඩසටහනට අදාළ නාම පුවරුවක් සැකසීම.( ආදර්ශය මේ සමග අමුණා ඇත.)
- රෝපණ ද්‍රව්‍ය සහ අනිකුත් අවශ්‍ය දෑ නියමිත දිනට හා වේලාවට ගත හැකි වන සේ සපයා ගැනීම.
- ප්‍රචාරාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සමාරම්භක වැඩසටහනේදී රෝපණය කරනු ලබන පැළ රැක බලා ගැනීම, නඩත්තු කිරීම සඳහා එම වසමේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් තෝරා ගත් හරිත උයන් කමිටුව පත් කිරීම, සහ මෙහෙයවීම මෙන්ම අධීක්ෂණ කටයුතු සඳහා එම කමිටුව වගකිය යුතු නිළධාරියෙකුගේ යටතට පත් කිරීම. (උදා:- පරිසර නිළධාරීන් වැනි)
- සහාය ආයතන/ සංවිධාන/ නිළධාරීන්/ පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය සහයෝගය ලබා ගැනීම.
- රෝපිත පැළ රැක බලා ගැනීම සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම.

03.04 සමාරම්භක වැඩසටහනෙන් පසුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම තෝරා ගනු ලබන අනිකුත් ඉඩම්, භූමි ප්‍රදේශ, ස්ථානවල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා හඳුනා ගත් ස්ථාන පිළිබද විස්තරය, රෝපණය කිරීමට හඳුනාගත් පැළ වර්ග(විශේෂයෙන් කුඹුක්, මී හා ඇහැළ වැනි ශාක) සහ අනෙකුත් අවශ්‍යතා ඇතුලත් කොට ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම සමෘද්ධි හරිත උයන නමින් සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් සකස් කොට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තු ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

03.05 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශතුළ පිහිටි සියලුම රාජ්‍ය/ පෞද්ගලික/අර්ධ රාජ්‍ය/ආයතන/සංවිධාන සම්බන්ධ කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස ද දන්වමි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය දැව සංස්ථාව සම්බන්ධ කර ගැනීමෙන් අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව ලබා ගැනීමට හැකි වන අතර ඒ සඳහා දිසාවන නිළධාරිගේ සහාය ලබා ගැනීම වැදගත් වේ. මාසිකව පවත්වනු ලබන දිස්ත්‍රික් කමිටු රැස්වීම් ප්‍රාදේශීය කමිටු රැස්වීම් සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනගා ගැනීමට ද අවධානය යොමු කරමි.

03.06 "සමෘද්ධි හරිත උයන" වැඩසටහනට සමගාමීම පරිසර සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාමීය මට්ටමින් පැවැත්වීමද ඉතා වැදගත් බව අවධාරණය කරමි.

03.07 "සමෘද්ධි හරිත උයන" වැඩසටහන යටතේ රෝපණය කරනු ලබන සෑම පැළයක්ම රැකබලා ගැනීම, නඩත්තු කිරීම, වාර්තා පවත්වාගෙන යාම, අත්‍යාවශ්‍ය වන අතර ඒ අනුව පසුවිපරම් ක්‍රියාවලියක් සිදු කිරීමද අත්‍යාවශ්‍ය බව අවධාරණය කරන අතර මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**04** <u>සම්බන්ධීකරණය</u>

සමෘද්ධි හරිත උයන ජාතික වැඩසටහන ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සඳහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ දුරකථන අංක පහත දැක්වේ.

දුරකථන අංකය:- අධ්‍යක්ෂ(සමාජ සංවර්ධන) - ඩබ්.ඒ.එල්. ලංකාතිලක 011-2889005

සහකාර අධ්‍යක්ෂ(සමාජ සංවර්ධන) - අයි.ඩී.එන්. සංජීවනී 011-2876601

ෆැක්ස් අංකය :- 0112889005

විද්‍යුත් තැපැල :- socialdev@divineguma.gov.lk

නීල් බණ්ඩාර හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :-

1. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මැතිතුමා - කා. අවධානය පිණිස

2. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මැතිතුමා -

කා.අවධානය පිණිස

3. ජනාධිපති ලේකම්
4. අග්‍රාමාත්‍ය ලේකම්
5. ලේකම් සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
6. ලේකම් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
7. ලේකම් මහා මාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
8. ලේකම් පලාත් පාලන අමාත්‍යාංශය
9. ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය
10. ලේකම් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11. වන සංරක්ෂණ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
12. අධ්‍යක්ෂ ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
13. සභාපති නාගරික සංවර්ධන අධිකාරිය
14. සභාපති ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
15. සභාපති මධ්‍යම පරිසර අධිකාරිය
16. සභාපති ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
17. සභාපති රාජ්‍ය දැව සංස්ථාව
18. අධ්‍යක්ෂ ජනරාල් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. සභාපති සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
20. සියළුම අංශ ප්‍රධානීන්, දිවිනැගුම දෙපාර්තමේන්තුව

} කා.දැ.ගැ.ස සහ අවශ්‍ය සහයෝගය ලබාදීම සඳහා